ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2021.05.11

සී.ඩී.වික්‍රමරත්න මහතා,
පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**<u>කොවිඩ් - 19 වසංගතයට අදාළව නිරෝධායන නියෝග කඩ කරන්නන් අත්අඩංගුවට ගැනීම.</u>**

කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ ශ්‍රී ලාංකිකයන් ලෙස අප සියලු දෙනාටම එම තත්වය පාලනය කිරීමට විශාල වගකීමක් ඇති බව සියලු දෙනාම හොඳින් දන්නා කරුණකි.

මෙහිදී පසුගිය දින කිහිපය තුළ මහජනතාව විසින් තම වගකීම පැහැර හැර, පනවා ඇති නිරෝධායන නීති උල්ලංඝනය කළ බවට දක්වමින් ඔවුන් පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගැනීම් සිදුකර, විවිධ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වූ බස් රථ වලින් ප්‍රවාහනය කරන අයුරු කොමිෂන් සභාවේ අවධානයට යොමු විය.

ඒ අනුව මෙම කොවිඩ් වසංගත තත්වය හමුවේ මෙම නීති උල්ලංඝනය කිරීම් පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග හදිසි කාලවකවානුවක් තුළදී වුවද, නීත්‍යානුකූලව විය යුතු බව හා සියලු දෙනාටම සමාන ආකාරයට විය යුතු බව පෙන්වාදීම අප කොමිෂන් සභාවේ යුතුකම බව සිහිපත් කිරීමට කැමැත්තෙමු.

ඒ අනුව ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ බලතල ප්‍රකාරව පහත කරුණු ඔබගේ අවධානයට ලක් කිරීමට කැමැත්තෙමු.

1. අත්අඩංගුවට ගැනීමට අදාළව නීතියේ දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අනුකූලව (අපරාධ නඩු විධාන සංග්‍රහය, පොලිස් දෙපාර්තමේන්තු නියෝග හා ගරු ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබාදී ඇති තීන්දු පිළිබඳව අවධානය යොමු කර) අත්අඩංගුවට ගැනීම් සිදුකිරීම.

2. කොවිඩ් වසංගත තත්වය යටතේ නිරෝධායන නීති උල්ලංඝනය කරනු ලබන සියලුම අයවළුන් සිදුකරනු ලබන ක්‍රියාවන් කිසිදු වෙනස්කමකට භාජනය නොකර සියලු දෙනාටම සමාන වන ලෙස ක්‍රියාත්මක කිරීම.

3. අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන යන පිරිස් නිරෝධායන නියෝග හා ඊට අදාළ මාර්ගෝපදේශ අනුව ප්‍රවාහනය කිරීම.

ඒ අනුව හදිසි අවස්ථාවකදී වුවද, නීතියෙන් බැහැරව සිදුකරනු ලබන තාවකාලික ක්‍රියාකලාපයන් තුළින් සිදුවන ඍණාත්මක බලපෑම් මුළු මහත් සමාජයටම භුක්ති විඳීමට සිදුවන බැවින්, නීතියේ දක්වා ඇති ක්‍රමවේදයන් අනුගමනය කිරීමට නීතිය ක්‍රියාත්මක කිරීමට ඇපකැප වී සිටින පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගන්නේ නම් මැනවි.

ආචාර්ය ජගත් බාලසූරිය
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ආචාර්ය ජගත් බාලසූරිය,
සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ස/-

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk